




# සුදු නෙළුම

*සුදු නෙළුම කෝ - -*
*සොරබොර වැවේ*
*මල් සුවඳ දුන් මහියංගනේ*
*පුන් පෝය දා පසළොස්වකේ*
*මල් නෙළා විකිණු - පන්සලේ*

*වැවට කළුවර යාවුණා*
*සංසාර දුක බෝ වුණා*
*නෙලූ මල් මිට ඉහිරුණා*
*එහා ඉවුරට පාවුනා*

*සිහින් සිරිපොද වෑහුනා*
*ඉවුරු දෙකොපුල සේදුනා*
*සුදු නෙළුම් මල දෑස පියවී*
*මෙහා ඉවුරට යා වුණා*

''සාම්ප්‍රදාය කියන්නේ නිර්මාණයකදී නිරායාසයෙන් කලා කෘතියකට ගලා එන ගුණයක්. සමාජයෙන් දැනෙන දේ සංවේදීව උකහා ගන්නා ගීත රචකයා එය හොඳම වචන හොඳම පිළිවෙලට යොදාගෙන පොදු නිර්මාණයක් කරනවා.
''සන්නිවේදනය කියන්නේ අපේ අත්දැකීම් බෙදා හදා ගන්නා දෙයක් විය යුතුයි. අත්දැකීමෙන් තමා ලබා ගන්නා දේ නිර්මාණාත්මකව පොදු දෙයක් බවට පත් කර ගැනීමයි විය යුත්තේ.''

ප්‍රවීණ රංගන ශිල්පී ජයලත් මනෝරත්නයන් ඉහත ප්‍රකාශයන් කෙරීමෙහි යෙදුණෝ මෙල්බර්න් ගායන ශිල්පිනී ශිරෝමා ප්‍රනාන්දුගේ ''නුඹ ළඟ මං'' සංගීත තැටිය කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ එළිදැක්වුණා වූ උත්සවයේදී ආරාධිත දේශනය කරමින්. අත්දැකීමක් ඇසුරින් ගීයක් නිර්මාණය පිළිබඳව වැඩිදුරටත් කරුණු දැක්වූ මනෝරත්නයන් එහිදී ගෙන හැර පෑ අගනා නිදසුනකින් මෙවර ''ගී සඳළුව'' අලංකාර වෙනවා.

''ඔබ කවුරුත් දන්නා රත්න ශ්‍රී විජේසිංහ, විශිෂ්ටතම ගේය පද රචකයා, කාලයකට පෙර ගුරුවරයෙක් වශයෙන් පත්වීමක් ලැබිලා මොණරාගලිනුත් එපිට ප්‍රදේශයක රැකියාවකට ගියා. ඉතාම දුෂ්කර පළාතක්. පාසැලේ තිබුණේ එක ගොඩනැගිල්ලයි. ඒකත් කටුමැටි ගහපු, පොල් අතු වහපු එකක්. රත්න ශ්‍රී ගේ පන්තියේ හිටියා ඉතාම හුරුබුහුටි දක්ෂ දැරිවියක්. ඒ වගේම ඇය ඉතාම දුප්පත්. ඇයයි පන්තියේ පළවෙනියා.'' මනෝරත්නයන් හැඟීම බරව අත්දැකීම විස්තර කළා.

''දවසක් පන්තියේ උගන්වන්න ගන්න කොට රත්න ශ්‍රී දැක්කා පන්තියේ හිස් තැනක්. අර කුඩා දැරිවිය එදා පාසැල් ඇවිත් හිටියේ නෑ. වෙලාව උදේ නවය වුණා. දහය වුණා. දහය හමාරත් වුණා. එකොළහ, එකොළහ හමාර වෙනකොට පාසැලට ගලාගෙන එනවා ඉතාම බේදනීය ආරංචියක්. අර දැරිවිය මිය ගිහින්. ඉ රත්න ශ්‍රී ට උහුලා ගන්න බෑ. ඔහු ගියා ඇයගේ නිවස සොයාගෙන. අඩුගණනේ ඇයගේ මිණිය තියන්නවත් ගෙපැල ඉඩ නෑ. එළිමහනේ මැස්සක් ගහලා මිනිය තියලා තිබුණා.'

''වැවට ගිහින් නෙළුම් කඩලා, ඒවා විකුණාපු මුදලිනුයි ඒ දැරිය පොත්පත් ගන්නේ. අපි දන්නවා ගම්වල නෙළුම් මල් විකුණාන්න බෑ. ඒත් මේ දැරියගේ අසරණ බව නිසාම රුපියලක් , එකයි පණහක් දීලා මල් ගන්නවා ගමේ අය.''
''දැරිවිය කලින් දවසේත් මල් නෙලන්නට යනවා. ඒත් ඒ නො පුරුදු තැනක, මඩ ගොහොරුවක එරිලා - පහුවදා උදේ මිණිය පාවෙනකල් කවුරුවත් දන්නෙ නෑ මොකද වුණේ කියලා.''

''රත්න ශ්‍රී අතේ තිබුණ මුදලකුත් දීලා ආපහු ආවා. ජීවිතයේ කම්පනයක් සසලවීමක් වුණාම තව කාට හරි කියන්න ඕන. රත්න ශ්‍රී ට කවුරුවත් හිටියෙ නෑ මේ ගැන කියන්න. ඔහු කවියෙක් නිසා තමන්ගේ හිතට ආව ප්‍රකම්පනය පොඩි කොල කෑල්ලක පද පෙළක් විදියට ලිව්වා.''

''මා ඒ කිව් ඇත්ත සිද්ධිය අත්දැකීම ඇසුරින් උපමා උපමේය හා පරිසරය සම්බන්ධ කර ගනිමින් ලියුව ඒ පදපෙළ පසුකාලයකදී අමරදේවයන් තනුව යොදාගෙන බොහෝම හැඟීම් බරව ගායනා කළා''

''මේ මරණයේ තිබෙන විශේෂත්වය මොකක්ද? අපේ සමාජයේ එක්තරා පන්ති ස්ථරයක තියෙන බේදනීය බව කියවෙන නිදර්ශනයක් මේ. රත්න ශ්‍රී ගේ නිර්මාණයෙන් ඒ බේදනීය බව අපූරුවට කියවෙනවා.''

''එදා ගමේ අයට අඬන්න ඇස්වල කඳුළු තිබුණේ නෑ. ඉඩෝරය, වල්අලි, කු-සගින්න වගේ දේවල් නිසාම ඒ අයට මේක තවත් එක බේදවාචකයක් විතරක් වෙන්න ඇති.

''ඒත් මේ ගීතය අමරදේවයන් ගයන්නට ප්‍රථම රත්න ශ්‍රී ගෙන් මේ කතාව අහපු ශාලාවේ උන්න දාහකට වැඩි හැමෝම වගේ ගීය ගායනා වෙනකොට හදවතින් හරි අඬන්න ඇති.'' මනෝරත්නයන් දේශනය නිමා කළා.

